# ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE


මගේ අංකය / எனது இல. / My No. SIF/C/AG/AE/2022/02

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2022 අප්‍රේල් 08 දින

ලැබුණා
08 APR 2022
4.05 p.m.
ප්‍රධාන ලේකම්
බස්නාහිර පළාත

ප්‍රධාන ලේකම්,

බස්නාහිර පළාත් සභාව

**කොළඹ මහ නගර සභාවේ රථ වාහන ගාල් පරිපාලනය පිළිබඳ විශේෂ විගණනය**

---

උක්ත විගණන පරීක්ෂණයට අදාල විගණන විමසුමක් මේ සමඟ ඉදිරිපත් කර ඇත.

02. එම විගණන විමසුමෙහි සඳහන් ඔබගේ විෂය පථයට අදාල කරුණු සඳහා , 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 38.1 වගන්තිය, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 155 රෙගුලාසිය හා සියලු අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් ප්‍රධාන ලේකම් වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන්/රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන් අමතා ජනාධිපති ලේකම් විසින් නිකුත් කර ඇති 2012 අප්‍රේල් 09 දිනැති PCMD/AD/2/1/1/26 දරණ ලිපිය කෙරෙහි ද අවධානය යොමු කරමින් දින 14ක් ඇතුළත පිළිතුරක් යොමු කරන මෙන් කාරුණිකව ඉල්ලමි.

එස්.එම්.ඩී.එස්. සුදීශ් රෝහිත

නියෝජ්‍ය විගණකාධිපති (විශේෂ විමර්ශන හා චෝහාරික)

විගණකාධිපති වෙනුවට

පිටපත්-

1. ලේකම්, පළාත් පාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු ජලසම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු අමාත්‍යාංශය, බ.ප.
2. ලේකම් , පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය
3. පළාත් පාලන කොමසාරිස් - බ.ප
4. නාගරික කොමසාරිස් - කොළඹ මහනගර සභාව


අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

**විගණන විමසුම - AUDIT QUERY - கணக்காய்வு விசாரணை**

විමසීම් අංකය / விசாரணை இலக்கம் / Query No.: SIF/C/AG/AE/2022/02

නිකුත් කරන දිනය / வழங்கிய திகதி / Date of issue: 2022 අප්‍රේල් 08 දින

Addressed to: ප්‍රධාන ලේකම්, බස්නාහිර පළාත් සභාව

වෙතටයි / அவர்களுக்கு

විෂයය / விடயம் / Subject: **කොළඹ මහ නගර සභාවේ රථ වාහන ගාල් පරිපාලනය පිළිබඳ විශේෂ විගණනය**

**මෙය පැහැදිලි කිරීම සඳහා තොරතුරු කැඳවීමක්/විමසීමක් වන අතර විගණන වාර්තාවක් නොවේ.**
**இவ் விசாரணை தகவல்களைப் பெற்றுக் கொள்ளவும், பகுப்பாய்வதற்காகவுமே அன்றி இது ஒரு கணக்காய்வு அறிக்கை அல்ல.**
**This is only a query calling for information for clarification and not an audit report.**

---

නගර සභා සීමාව තුල රථ වාහන නැවැත්වීමේදී ගාස්තු අය කිරීම 1988 වර්ෂයේදී පමණ ආරම්භ කර රථවාහන පාලක/පාලිකාවන් මගින් සිදු කර තිබූ අතර, 2010 වර්ෂයේ සිට පෞද්ගලික පාර්ශවයන් ද සම්බන්ධ කරගනිමින් එකී ගාස්තු අය කිරීමේ ක්‍රමවේදය අනුගමනය කර තිබිණි.

කොළඹ මහ නගර සභා බල ප්‍රදේශය තුල වර්ගමීටර 99,000ක පමණ භූමි ප්‍රදේශයක එක්වරකට වාහන 7000ත් 7500ත් අතර ප්‍රමාණයක් ගාල් කල හැකි වාහන නැවතුම් ස්ථාන 121 ක් පවතින අතර මෙයින් වර්ගමීටර 85,800ක පමණ භූමි ප්‍රදේශයක් සහිත වාහන 6500ක් පමණ ගාල් කල හැකි වාහන ගාල් 112ක් පෞද්ගලික සමාගම් 19කට කොන්ත්‍රාත් පදනම මතද, වර්ගමීටර 8,620 ක්වූ වාහන ගාල් කරන ස්ථාන 9ක් නගර සභාවේ රථවාහන පාලිකාවන් මගින් ගාස්තු අයකර පවත්වාගෙනයාම සඳහාද, ලබා දී ඇති අතර මීට අමතරව වාහන 111ක් ගාල් කල හැකි එකතුව වර්ගමීටර 1,279ක් වූ භූමි ප්‍රදේශයක වාහන ගාල් කරන ස්ථාන 111ක් මහ නගර සභාවේ මන්ත්‍රීවරුන්ටද, වාහන 26ක් ගාල් කල හැකි එකතුව වර්ග මීටර 299ක් වූ ගාල් කරන ස්ථාන 26ක් මාසික ගාස්තු ගෙවීමේ පදනම මත ව්‍යාපාර ස්ථානවල පාවිච්චිය සඳහාද, වාහන 1426 ක් ගාල් කල හැකි ගාලු පාර, ඩුප්ලිකේෂන් පාර හා ඒ ආශ්‍රිත අතුරු මාර්ගවල රථගාල් ටිකට්පත් නිකුත්කරන ස්වයංක්‍රිය යන්ත්‍ර මගින් ගාස්තු අයකිරීම සඳහා පෞද්ගලික ආයතනයකටද නීත්‍යානුකූලව වෙන්කර තිබුණි.

2. කොළඹ මහා නගර සීමාව තුළ අනවසරයෙන් වාහන ගාල් කිරීම් තහනම් කිරීම, ගාල් කිරීම සඳහා නැවතුම් ස්ථාන ඇති කිරීම සහ විධිමත් කිරීම, ගාස්තු අය කිරීම සඳහා සහ පැහැර හැරීම් පාලනය කිරීම සඳහා සහ ඊට අනුෂාංගික කරුණු සඳහා විධිවිධාන සලසා ගැනීම සඳහා නගර සභා ආඥා පනතේ 268 වගන්තිය හා 272(32) උපවගන්තියේ විධි විධාන ප්‍රකාරව නිකුත් කරන ලද , අංක 2029/29 දරණ, 2017 ජූලි මස 26 දිනැති ගැසට් පත්‍රයෙන්, වාහන ගාල් කිරීමේ අතුරු ව්‍යවස්ථාව අනුමත කර තිබිණි.

එම අතුරු ව්‍යවස්ථාවෙන් වාහන ගාල් පරිපාලනය සඳහා පහත කොන්දේසිද ඇතුලත්ව නීති පනවා තිබුණි.



අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

I. 04 (i) වගන්තිය - වාහන නැවැත්වීම් ස්ථාන දක්වන දැන්වීම් වාහන නවත්වන ස්ථානවල මහජනතාවට පෙනෙන පරිදි ප්‍රදර්ශනය කල යුතුය.

II. 04 (ii) වගන්තිය - මාර්ගයන්හි රථවාහන ගාල් කරන ස්ථාන නගර සභාවේ ඉංජිනේරු කාර්යංශය මඟින් ඉංජිනේරු න්‍යායන්ට හා පිරිවිතරවලට අනුකූලව ලකුණු කල යුතුය.

III. 08 හා 18 වන වගන්තිය - ගාල් කිරීමේ අරමුණින් තොරව නැවතුම්පල බිම් කඩවල් භාවිතා නොකල යුතුය.

IV. 09 වන වගන්තිය- මෝටර් වාහනයක් වාහන නැවැත්වීමේ බිම් කඩක ඇතුලු කිරීම හෝ ගාල් කිරීම සිදු කරන්නේ නම් නගර සභාවේ බලය ලත් පාර්ශවයක් විසින් නිකුත් කරන ලද අදාල ගාස්තු ගෙවා ලබා ගත් අවසර පත්‍රයක් තිබීම අනිවාර්ය වේ.

V. 11(IV), (V), (VI) හා (VII) උපවගන්ති - ගාස්තු නොගෙවා ගාල් කෙරෙන රථ වලින් ප්‍රමාද ගාස්තු අය කිරීමේ නෛතික ක්‍රියාවලිය ක්‍රියාත්මක කල යුතුය.

3. කොළඹ මහ නගර සභාව සතු රථ වාහන ගාල්වල ගාස්තු අය කිරීම සඳහා පෞද්ගලික ආයතන වෙත කොන්ත්‍රාත් පදනම මත ලබා දීම

---

කොළඹ මහ නගර සභාවේ රථවාහන පාලක/පාලිකාවන් විසින් සිදුකර තිබූ රථවාහන ගාල් කිරීමේ ගාස්තු අය කිරීමේ කටයුතු 2010 වර්ෂයේ සිට පෞද්ගලික ආයතන වෙත කොන්ත්‍රාත් පදනම මත ලබා දී තිබුණි. 2020 දෙසැම්බර් 31 දින වන විට කොළඹ මහ නගර සභාව සතු රථවාහන ගාල් 112න් 100ක් පෞද්ගලික ආයතන 19ක් වෙත **(ඇමුණුම 01)** ගාස්තු අයකිරීම සඳහා ලබා දී තිබූ අතර පහත කරුණු අනාවරණය විය.

3.1 කොන්ත්‍රාත් ප්‍රදානය කිරීම

---

3.1.1 රථගාල් කිහිපයක් එක් කර අදියරක් ලෙස සලකා එම අදියරයන් යටතේ ලංසු කැඳවා පෞද්ගලික ආයතන තෝරාගෙන තිබුණි. ඒ අනුව 2010 වර්ෂයේ සිට 2021 දක්වා අදියර 18ක් යටතේ රථගාල්වල ගාස්තු අයකිරීම සඳහා පෞද්ගලික ආයතන වෙත කොන්ත්‍රාත් පදනම මත ලබා දී තිබූ අතර 2020 වර්ෂයේදී 17වෙනි අදියර යටතේ සමාගම් 6 ක් වෙත රථ වාහන නැවතුම් ගාල් (බිම් කඩවල්) 18ක් ද, 2021 වර්ෂයේදී 18 වෙනි අදියර යටතේ සමාගම් 8 ක් වෙත රථවාහන නැවතුම් ගාල් 30ක් ගාස්තු අයකිරීම සඳහා පවරා දී තිබුණි.

3.1.2 අදියර 1 සිට අදියර 16 දක්වා මිල ගණන් කැඳවීම සඳහා ගාලකින් ලැබිය යුතු මාසික අවම කුලි වටිනාකම තීරණය කිරීමේදී මීට පෙර රථ වාහන පාලික/පාලිකාවන් විසින් නගර සභාව වෙත ඒ ඒ ගාල්වලින් අයකර ලබා දුන් ආදායම පදනම් කරගෙන තිබුණි.

3.1.3 අදියර 17 හා 18 සඳහා මිල ගණන් කැඳවීමේදී එක් එක් රථවාහන ගාල්වලින් නගර සභාවට ලැබිය යුතු ආදායම තක්සේරු කිරීමේදී දෛනිකව ගාල් කරන වාහන ප්‍රමාණය ගාලෙන් ගාලට වෙනස් වුවද (රථවාහන ඝණත්වය), ඒ පිළිබඳ සැලකීමකින් තොරව රථගාලෙහි වාහන ධාරිතාවය සහ වාහනයකින් අය කරන ගාස්තුව සැලකිල්ලට ගනිමින් ලැබිය යුතු මාසික ආදායම ගණනය කර තිබූ අතර, එම මාසික තක්සේරු ආදායමෙන්, කොන්ත්‍රාත්කරුවන් විසින් යොදවන රථවාහන පාලකයින්ගේ වැටුප් ගෙවීම් සඳහා වන පිරිවැය සහ කොන්ත්‍රාත්කරු විසින් දැරිය යුතු පොදුකාර්ය පිරිවැය, ලාභය සහ මුදල් නොගෙවන්නන් නිසා ඇතිවන අලාභය වෙනුවෙන් මාසික ආදායමෙන් 35%ක් අඩු කිරීමෙන් පසු අගය නගර සභාවේ අපේක්ෂිත මාසික ආදායම ලෙස ගෙන තිබුණි.

3.1.4 එලෙස තක්සේරු ආදායමෙන් 35%ක් අඩුකර නගර සභාවට අයවිය යුතු අපේක්ෂිත ආදායම පදනම් කර පෞද්ගලික ආයතන වෙත ලබා දී තිබූ රථගාල්වල රජයට අයත් වාහනවලින්ද ගාස්තු අය කිරීම අනිවාර්ය කරමින් පුවරු ප්‍රදර්ශනය කර තිබුණි.

3.2 පෞද්ගලික ආයතන සමඟ ගිවිසුම්ගත වීම හා රථගාල් පරිපාලනය

---

3.2.1 පෞද්ගලික ආයතන සමඟ ගිවිසුම් ගත වීමේදී පහත කොන්දේසි හා එකඟතාවයන් ගිවිසුම් තුල ඇතුලත් කර තිබිණි.

I. එකඟ වූ රථ වාහන ගාල් කුලිය සෑම මසකම එකඟ වූ නිශ්චිත දිනක ගෙවිය යුතු අතර නිශ්චිත දිනයේදී නොගෙවන්නේ නම් හිඟ මුදල මත 2% ක අතිරේක ගාස්තුවක් සමග ගෙවිය යුතු බව.

II. නගර සභාව වෙත ගෙවිය යුතු මුලු හිඟ මුදල, මාස 2ක එකඟ වූ මාසික ගාස්තුවල එකතුවට සමාන හෝ ඉක්මවන්නේ නම්, පෙර දැනුම් දීමකින් තොරව ගිවිසුම් අත්හිටු වීමට නාගරික කොමසාරිස් වෙත බලය ඇති බව.

III. සහන ගාස්තු පදනමින් ගාල් කෙරෙන රථවාහන නිසා මූල්‍යමය අවාසියක් වන්නේ නම් එම අවාසිය කොන්ත්‍රාත්කරු විසින් දරා ගත යුතු බව.

IV. තෝරා ගත් කොන්ත්‍රාත්කරු විසින් රථවාහන ගාස්තු අයකිරීම සඳහා සේවයේ යොදවන සේවකයින් රාජකාරියෙහි නියැලෙන විට සභාව විසින් නියම කරන නිල ඇඳුමකින් හා රාජකාරී හැඳුනුම්පතක් පැලඳගෙන සිටිය යුතු බව

V. සභාව විසින් ලබා දෙන ආකෘතිය ප්‍රකාරව වාහනය ගාල් කල වෙලාව, පිටත් වූ වෙලාව, වාහන අංකය, අය කරන ගාස්තුව සහ වෙනත් කරුණු ඇතුලත් කරන ලද ප්‍රවේශ පත්‍රයක් භාවිතා කළ යුතු බව හා ප්‍රවේශ පත්‍ර නිකුත් නොකර ගාස්තු අය නොකල යුතු බව.

VI. රථවාහන ගාල් කෙරෙන ප්‍රදේශය තුල වෙනත් කිසිදු ව්‍යාපාර කටයුත්තක් හෝ ගාල් කෙරෙන වාහන සඳහා ස්ථිර ප්‍රදේශ වෙන් නොකල යුතු බව.

VII. ගිවිසුම් ගත ප්‍රදේශ හැර වෙනත් ප්‍රදේශවල රථවාහන ගාස්තු අය නොකල යුතු බව.

VIII. ගාස්තු අය කිරීම සඳහා යොදවා ඇති සේවකයින් රථගාල් භාවිතා කරන පාර්ශව සමඟ ගෞරවාන්විතව හා වගකීමෙන් කටයුතු කළ යුතු බව.

3.2.2 කොන්ත්‍රාත් පිරිනැමීමේ 18වන අදියර යටතේ බොරැල්ල මංසන්දියේ සිට මරදාන දක්වා රථවාහන 118ක් ගාල් කර ගාස්තු අය කිරීම සඳහා කිලෝ මීටර 2ක් පමණ දුර මාර්ගය අනු කොටස් 5කට බෙදා තනි රථගාලක් ලෙස K Two logistics services නමැති පෞද්ගලික කොන්ත්‍රාත් කරුවෙකු වෙත ප්‍රදානය කර තිබූ අතර, එම අදියරේදීම නොරිස් කැනල් මාර්ගයේ වාහන 144 ක් ගාල් කිරීම සඳහා තනි රථ ගාලක් ලෙස සලකා AR Enterprises නමැති පෞද්ගලික ආයතනය වෙත පවරා දී තිබුණි. මෙම නොරිස් කැනල් රථ ගාලෙහි ආසිරි සෙන්ට්‍රල් පෞද්ගලික රෝහල ඉදිරි පිට කොටසේ වාහන 41ක් පමනක් මාර්ගයට තිරස් වන පරිදි පමණක් වාහන ගාල් කල යුතු බවට ගිවිසුම් ගත වී තිබුණි.

රථගාල් ගාස්තු අය කිරීම සඳහා කොන්ත්‍රාත් ලබා දී තිබූ පෞද්ගලික ආයතන විසින් නගර සභාවට ගෙවිය යුතු මාස දෙක ඉක්මවූ හිඟ කුලි මුදල් 2017 දෙසැම්බර් 31 දිනට ආයතන 15කින් රු. 42,920,325ක්ද, 2018 දෙසැම්බර් 31 දිනට ආයතන 23කින් රු. 92,551,949ක්ද, 2019 දෙසැම්බර් 31 දිනට ආයතන 29කින් රු 127,175,601ක්ද 2020.12.31 දිනට ආයතන 36කින් රු. 180,412,174ක් හා 2021 දෙසැම්බර් 31 දිනට ආයතන 38කින් රු. 367,270,159 ක්ද විය. **( ඇමුණුම 02)**

3.3 මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

3.3.1 පෞද්ගලික ආයතන තෝරාගැනීම සඳහා මිල ගණන් කැඳවීමේදී පෙර කුලි ගෙවීම් පැහැර හැර ඇති ආයතන නුසුදුස්සන් බවට පත්වන බවට ලංසු ලියවිලිවල කොන්දේසි යටතේ දක්වා තිබියදී ලංසු ඇගයීම සිදු කරන අවස්ථාව වන විට කුලී ගෙවීම් පැහැර හරින ලද පෞද්ගලික ආයතන වලට නැවත වරක් වාහන ගාල් ලබා දී තිබූ බව නිරීක්ෂණය විය.

3.3.1.1 Sadid Enterprises ආයතනයට 2015, 2016 හා 2017 වර්ෂවල වාහන ගාල්කිරීමේ ගාස්තු අය කිරීම සඳහා ප්‍රදානය කරන ලද කොන්ත්‍රාත් 6කට අදාලව රු. 9,947,734ක මුදලක් නගරසභාවට ගෙවීම් පැහැර හැර තිබියදී **(ඇමුණුම 03),** 2018 මාර්තු 16 දින, 2018 ඔක්තෝබර් 05 දින සහ 2018 නොවැම්බර් 01 දින පිළිවෙලින් අංක 10/2018,

26/2018 හා 34/2018 දරණ ගිවිසුම් මගින් රථගාල් 3ක් එම ආයතනයට ලබා දීමට කටයුතු කර තිබූ බව නිරීක්ෂණය විය.

3.3.2 ලංසු ලියවිලිවල අංක 13.1 යටතේ, සහ කොන්ත්‍රාත් ගිවිසුමෙහි අංක 24 යටතේ රථවාහන ගාල් කිරීම නිසා වාහනවලට හා පදික මාරුවලට සිදුවන අපහසුතා හා අවහිරතා අවම වන පරිදි ලබා දී ඇති නිශ්චිත ප්‍රදේශයෙහි රථවාහන ගාල් කිරීමට අසමත් වුවහොත් එලෙස අසමත්වන අවස්ථාවකට රු.2500 බැගින් දඩමුදලක් කොන්ත්‍රාත්කරුවන්ගෙන් අය කරගත හැකි බව දක්වා තිබුනද එලෙස අය කර ගැනීමට කටයුතු කර නොතිබූ බව නිරීක්ෂණය විය.

3.3.2.1 නොරිස් කැනල්හි රථවාහන ගාලෙහි වසර ගණනාවක සිට මාර්ගය අවහිර වන අයුරින් වාහන ගාල් කිරීමට අදාල පෞද්ගලික ආයතනය ක්‍රියා කලද, එය වැලැක්වීමට නගර සභාව විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබූ බවත් එම කොන්ත්‍රාත්කරුගෙන් අදාල දඩ මුදල් එක් වරක් හෝ අයකරගෙන නොමැති බවත් නිරීක්ෂණය විය.

3.3.3 නගර සභාව විසින් රථ වාහන පාලක/ පාලිකාවන් මගින් ගාස්තු අය කිරීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් ප්‍රශස්ථ පාලන ක්‍රමවේදයක් ක්‍රියාත්මක කර තිබූ බව අනාවරණය නොවූ අතර, එම නිසා නගර සභාවට අයවිය යුතු ආදායම් අඩු මට්ටමක තිබී ඇති අතර, එම ආදායම පදනම් කරගෙන අදියර 1 සිට අදියර 16 දක්වා පෞද්ගලික ආයතනවලට ලබා දුන් ගාල්වල මාසික තක්සේරු කුලිය තීරණය කිරීම නිසා එම අදියරයන්හිදී පෞද්ගලික ආයතනවලින් නගර සභාවට අයකරගත හැකිව තිබූ ආදායම අහිමි වී තිබිය හැකි බව නිරීක්ෂණය විය.

3.3.4 උක්ත 3.1.3 ඡේදය පරිදි තක්සේරු ආදායමෙන් පිරිවැය ලෙස 35%ක් අඩු කිරීම මත රථ වාහන ගාල්වල මුළු ඇස්තමේන්තුගත ආදායමෙන් අදියර 17 දී රු. 111,586,176 ක් සහ අදියර 18 දී රු. 335,696,324 ක් නගරසභාවට අහිමි වි ඇති බව නිරීක්ෂණය වූ අතර මෙම ආදායම් අහිමි වීම ගාල්වල මුළු ඇස්තමේන්තු ආදායමෙන් 54%ත් 80%ත් අතර ප්‍රතිශතයක් බව නිරීක්ෂණය විය. **(ඇමුණුම 04)** (අදියර 18 හි අහිමි වූ ආදායම ගණනය කිරීමේදී යොදාගැනීමට ඉඩදුන් වාහන පාලකයින් සංඛ්‍යාව හා අපේක්ෂිත මාසික ආදායම යන තොරතුරු ලබා නොදීම හේතුවෙන් අදියර 17 හි දී ඇති තොරතුරුවලට සානුපාතිකව යමින් එම අගයන් ගණනය කරනු ලැබීය.)

3.3.5 රථ ගාල් පවතින ස්ථාන අනුව එකින් එකට රථ වාහන ගණත්වය (Parking Density) වෙනස් වුවද, උක්ත 3.1.3 හි අපේක්ෂිත මාසික තක්සේරු ආදායම ගණනය කිරීම සෑම රථගාලකටම පොදුවන අයුරින් ස්ථාවර ක්‍රමවේදයකට සිදු කිරීම හා රථවාහන ගණත්වය අනුව එක් එක් රථගාලට අනුරූපව ආදායම් ඇස්තමේන්තු සිදු නොකිරීමත් හේතුවෙන් මිල ගණන් කැඳවීමේදී ආයතන විසින් ඉදිරිපත් කර තිබූ මිල ගණන් හා නගර සභාව තක්සේරු කල අපේක්ෂිත අවම ආදායම හා සැසඳීමේදි තක්සේරු වටිනාකමට සාපේක්ෂව 8% සිට 268% දක්වා ඉතා ඉහල විචලනයක් පැවති අතර **(ඇමුණුම 05)** මිල ගණන් කැඳවීමේදී මහනගර සභාව විසින් අපේක්ෂිත ආදායම සාධාරණ තක්සේරුවක් සිදුකර නොමැති බවට නිරීක්ෂණය විය.

3.3.6 ඉහත 3.1.3 ඡේදයෙහි සඳහන් පරිදි අපේක්ෂිත මාසික ආදායම ගණනය කිරීමේදී රථ වාහන පාලකයින්ට වැටුප් ගෙවීම සඳහා මුදල් වෙන් කර තිබුනද, විගණනය විසින් සිදුකල භෞතික පරික්ෂාවේදී රථගාල්වල යොදා සිටින රථවාහන පාලකයින්ට වැටුප් ගෙවීම වෙනුවට අදාල පෞද්ගලික ආයතන විසින් රථවාහන පාලකයින්ට නියම කර ඇති දෛනික ඉලක්කගත ආදායම ඉක්මවන ඉතිරිය රථ වාහන පාලකයින් සිය දෛනික ආදායම ලෙස හිමිකර ගන්නා බවත් විගණනයට අනාවරණය විය. ඒ හේතුවෙන් රථ වාහන පාලකයින් වාහන ගාල් කරන්නන්ගෙන් කෙසේ හෝ මුදල් ලබාගෙන තම දෛනික ආදායම උපරිම කර ගැනීමට කටයුතු කරන බවත් එම නිසා ආචාරශීලි බව ගිලිහී ඇති බවත්, පෞද්ගලික ආයතන ඉහළ ලාභ උපයන බවත් විගණනයේදී නිරීක්ෂණය විය.

3.3.7 පෞද්ගලික ආයතන වෙත වාහන ගාල් කොන්ත්‍රාත් පදනම මත ලබා දීමේදී 3.1.3 ඡේදය පරිදි තක්සේරු කරන ලද ආදායමෙන් පිරිවැය ලෙස 35%ක වටිනාකමක් අඩුකර ඇති අතර මේ තුල වාහන ගාල් කර ගාස්තු නොගෙවා පැහැර හැරීමේ අලාභයද ඇතුලත් කර තිබුණි. එසේ තිබියදී, පෞද්ගලික ආයතන පවත්වාගෙන යන වාහන ගාල් තුල ප්‍රදර්ශනය කර ඇති පුවරුවල "රජයට අයත් වාහනවලින්ද ගාස්තු අය කරනු ලැබේ" යනුවෙන් දක්වා තිබූ බව නිරීක්ෂණය විය.

3.3.8 රාජකාරි කටයුතු සඳහා ධාවනය කරන රජයේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වාහන නවතා තැබීම් වෙනුවෙන් ගෙවීමට සිදුවන ගාස්තු ප්‍රතිපූර්ණය කිරීමේ ක්‍රමවේදයක් රජයේ නොමැති වුවත්, කොළඹ මහ නගර සභා බල ප්‍රදේශය තුල රජයේ වාහන නවතා තැබීම වෙනුවෙන් ගාස්තු ගෙවීම අනිවාර්ය බවට ප්‍රසිද්ධ දැන්වීම් ප්‍රදර්ශනය කර පෞද්ගලික ආයතනවලට රජයේ වාහන වලින් ගාස්තු අය කිරීම සඳහා කොළඹ මහ නගර සභාව විසින් විශේෂ ඉඩ ප්‍රස්ථාවන් සලසා තිබූ බවට නිරීක්ෂණය විය.

3.3.9 සභාව විසින් රථගාල් මගින් ආදායම් උත්පාදනය ආරම්භ කල මුල් අවධියේ සිට වර්තමානය වන විට රථවාහන පාලිකා තනතුරු සංඛ්‍යාව ක්‍රමානුකූලව අඩුකිරීමට කටයුතු කරමින් සිටින අතර, රථවාහන පාලක පාලිකාවන් සම්බන්ධයෙන් නිසි අභ්‍යන්තර පාලනයක් පවත්වා නොගැනීම නිසා හා ප්‍රශස්ථ ආදායම් තක්සේරුවක් කිරීමට සභාව අපොහොසත් වීම නිසා ඔවුන්ගෙන් නගර සභාව වෙත එකතු වූ ආදායම ඉතා අවම මට්ටමක පැවතී ඇති අතර, මෙම තත්වය පාදක කරගනිමින් පෞද්ගලික ආයතන හරහා රථගාල් වලින් ආදායම් එකතු කිරීමේ ක්‍රමවේදය ප්‍රවර්ධනය කිරීමට සභාව කටයුතු කර තිබිණි. පෞද්ගලික ආයතන සමඟ ඇති කරගෙන තිබූ ගිවිසුම් අනුව 17 වෙනි හා 18 වෙනි අදියර දෙක පමණක් සලකා බැලූ විට අදියර දෙක සඳහාම රු.188,118,000 ක මුදලක් පමණක් සභාව වෙත රථගාල් ආදායම ලෙස ලැබිය යුතුව තිබුණි. නමුත් ප්‍රශස්ථ ලෙස ආදායම් තක්සේරු කරමින් හා රථගාල් කලමණාකරණය සම්බන්දයෙන් නිසි අභ්‍යන්තර පාලන උපක්‍රම භාවිතා කරමින් රථවාහන පාලිකාවන් හරහා රථගාල් වල අදායම් එකතු කිරීම සිදු කළේනම් 17 වෙනි හා 18 වෙනි අදියර දෙක ක්‍රියාත්මක කල වසර දෙකක කාල සීමාව තුල අදියර 17හි හා අදියර 18 හි පිලිවෙලින් රු.128,194,560 ක

හා රු.401,926,412 ක ශුද්ධ ආදායමක් **(ඇමුණුම 06)** නගර සභාවට උපයාගත හැකිව තිබූ බව නිරීක්ෂණය විය.

3.3.10 ගිවිසුම් කොන්දේසි 4.2 යටතේ හිඟ මුදල් මාස දෙකක වාරිකයට සමාන වන හෝ එය ඉක්මවා යන අවස්ථාවලදී පෙර දැනුම් දීමකින් තොරව ගිවිසුම අත්හිටුවීමට කොළඹ නගර සභා නාගරික කොමසාරිස්ට බලය ඇති බවට ගිවිසුම් ගත වුවද, කොන්ත්‍රාත්කරුවන් දිගින් දිගටම ගෙවීම් ප්‍රමාද කලද කිසිදු කොන්ත්‍රාත්කරුවෙකුගේ ගිවිසුම් අත්හිටුවීමට කටයුතු කර නොමැති බව විගණනයේදී නිරීක්ෂණය විය.

3.3.11 රථගාල් ගාස්තු අය කිරීම සඳහා කොන්ත්‍රාත් ලබාගත් පෞද්ගලික ආයතන විසින් නගර සභාවට ගෙවිය යුතු මාසික කුලි මුදල් ගෙවීම් දිගින් දිගටම පැහැර හැර තිබූ අතර 2021 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු හිඟ ගාස්තු ආදායම් ලෙස ආයතන 38කින් රු. 367,270,159ක් අයකරගත යුතුව තිබූ බවට නිරීක්ෂණය විය. **(ඇමුණුම 02)**

3.3.12 ගිවිසුම් ප්‍රකාරව නගර සභාව විසින් වෙන්කර දී ඇති ස්ථාන හැර වෙනත් ස්ථානවල නවතන වාහනවලින් ගාල් කිරීමේ ගාස්තු අය නොකල යුතු වුවත්, නොරිස් කැනල් රථගාලෙහි DCSL ආයතනය ඉදිරිපිට මාර්ගයෙහි වාහන නැවැත්වීම තහනම් ලෙස මාර්ග සංඥා යොදා තිබියදී, නගර සභාවේ අනුමත බිම්කඩ සැලැස්මේ ඇතුලත් නොවන එම ප්‍රදේශයෙහි නොරිස් කැනල් රථගාලෙහි ගාස්තු අය කරන ඒ.ආර්. එන්ටර්ප්‍රයිසස් හි රථ වාහන පාලකයින් විසින් ත්‍රිරෝද රථ ගාල්කර ගාස්තු අයකරන බව නිරීක්ෂණය විය.

3.3.13 නාගරික ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ඉංජිනේරු (රථ වාහන, නිර්මාණ හා මාර්ග ආරක්ෂණ) විසින් අංක රහිත හා 2021 මාර්තු 5 දිනැතිව සියලුම රථගාල් කළමණාකරන පෞද්ගලික ආයතන වෙත නිකුත් කර ඇති ලිපිය මඟින් ලිපියෙහි දින සිට දින 30ක් ඇතුලත සියලු රථගාල් පවත්වාගෙන යන පෞද්ගලික ආයතන විසින් භාවිතා කල යුතු නිල ඇඳුම්, ටිකට් පත් සහ රථගාල් තොරතුරු ඇතුලත් පුවරු නගර සභාව ලබා දී ඇති ආකෘති අනුව පවත්වාගෙන යා යුතු බව හා එසේ නොකරන පෞද්ගලික ආයතන පවත්වාගෙන යන රථගාල් ටෙන්ඩර් අවලංගු කිරීමට කටයුතු කරන බව දන්වා තිබුනද, පෞද්ගලික ආයතන විසින් මෙතෙක් එකී ලිපියට ප්‍රතිචාර දක්වා තිබූ බව නිරීක්ෂණය නොවූ අතර නගර සභාව මෙතෙක් ටෙන්ඩර් අවලංගු කිරීමට හෝ වෙනයම් ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

3.3.14 ගිවිසුම් කොන්දේසි අනුව රථ වාහන ගාස්තු අය කිරීම සඳහා යොදා ඇති සේවකයින් රථවාහන ගාල් කිරීමේ ගාස්තු අය කරන සෑම අවස්ථාවකදීම හැඳුනුම්පතක් පැළඳ සිටිය යුතු අතර එහි රථ වාහන පාලකයාගේ නම ජනතාවට පහසුවෙන් කියවාගත හැකිවන පරිදි මුද්‍රණය කල යුතු අතර රථවාහන පාලකයින් නගර සභාවේ අනුමත නිලඇඳුම් හා නිල හැඳුනුම්පත් පැළඳ නොසිටියහොත්, එක් වරකට නිලඇඳුමට රු.300ක් හා හැඳුනුම්පතට රු.300 බැගින් දඩ අය කිරීමට නගර සභාවට හැකි වුවද එලෙස එක්වරක් හෝ දඩ අය කරගෙන තිබූ බව නිරීක්ෂණය නොවීය.

3.3.14.1 විගණනය විසින් සිදුකල භෞතික පරීක්ෂාවේදී ඩී.එල්. එන්ටර්ප්‍රයිසස් ආයතනය විසින් පවත්වාගෙන යන කිරුල පාර රථගාලෙහි, ග්ලෝබල් ඉන්ටර්නැෂනල් ආයතනය විසින් පවත්වාගෙන යන කින්සි පාර රථගාලෙහි සහ ඒ.ආර්. එන්ටර්ප්‍රයිසස් ආයතනය විසින් පවත්වාගෙන යන නොරිස් කැනල් රථගාලෙහි රථවාහන පාලකවරු ලෙස සේවයේ යෙදී සිටි කිසිදු අයෙකු එම තනතුරට නියමිත නිලඇඳුමක් හෝ හැඳුනුම්පත් පැළඳ නොසිටි අතර ඩී.එල්. එන්ටර්ප්‍රයිසස් සහ ඒ.ආර්. එන්ටර්ප්‍රයිසස් ආයතන යටතේ රථ වාහන පාලකයින් ලෙස සේවය කල අය නියමිත ආකෘතියෙන් පරිබාහිර ටිකට්පත් නිකුත් කරන බව නිරීක්ෂණය විය.

3.3.15 වාහනය නවතා තැබීමේ ගාස්තු අයකිරීමේ කාලය පෙ. ව. 06 සිට මධ්‍යම රාත්‍රී 12 දක්වා වුවත් නොරිස් කැනල් රථගාල හා රෝහල් ආශ්‍රිතව පවතින රථගාල් පවත්වාගෙන යන පෞද්ගලික ආයතන විසින් පැය 24 පුරාවටම මුදල් අයකරන බවට නිරීක්ෂණය විය.

3.3.16 පෞද්ගලික ආයතන එකොළහක් සඳහා ගාස්තු අයකිරීමට කොන්ත්‍රාත් පදනම මත ලබා දී තිබූ රථ ගාල් 29ක **(ඇමුණුම 07)** ගිවිසුම් කාලය 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් ව තිබූ අතර එදිනට එම කොන්ත්‍රාත්කරුවන්ගෙන් කොළඹ මහ නගරසභාවට රු.මිලියන 85.1ක් අයවිය යුතුව තිබිණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

3.3.16.1 ගිවිසුම් කාලය අවසන්වීමෙන් පසුව නැවත ටෙන්ඩර් කැඳවීමකින් තොරව මෙම රථගාල් 29හි රථවාහන ගාල් කිරීමේ ගාස්තු අයකිරීම එම ආයතනවලටම ලබා දී තිබූ බවට නිරීක්ෂණය විය.

3.3.16.2 ගිවිසුම් කාලය 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ පසුව 2022 ජනවාරි 01 සිට නව කොන්ත්‍රාත් කරුවන් තෝරා පත්කර ගත හැකි වන පරිදි ප්‍රසම්පාදන කටයුතු සිදුකිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබූ බවට නිරීක්ෂණය විය.

3.3.16.3 2021 දෙසැම්බර් 31 දිනෙන් ගිවිසුම් කාලය අවසන් වන බව සහ තවදුරටත් එම ආයතනවලටම රථගාල් පවත්වාගෙන යාම සඳහා අවස්ථාව ලබා දෙන ලෙස එම ආයතන විසින් රථවාහන හා මහාමාර්ග ආරක්ෂණ අංශයේ අධ්‍යක්ෂ (ඉංජිනේරු) වෙත කරන ලද ලිඛිත ඉල්ලීම් පදනම් කරගෙන මෙම රථගාල් 29 පවත්වා ගෙන යාමට එම ආයතන එකොළහට අවස්ථාව ලබා දී තිබූ බවට නිරීක්ෂණය වූ අතර එම ආයතනවලට ලිඛිත එකඟතාවක් ලබා දී නොතිබූ බවට ද නිරීක්ෂණය විය.

3.3.16.4 ගිවිසුම් කාලය අවසන් වීමෙන් පසුව තවදුරටත් ගිවිසුම් කාලය දීර්ඝ කරන්නේ නම් ඒ පිළිබඳ ව සභාව දැනුවත් කර සභා අනුමැතිය ලබා ගත යුතු වුවත් සභා අනුමැතියක් නොමැතිව රථවාහන හා මහාමාර්ග ආරක්ෂණ අංශයේ අධ්‍යක්ෂ (ඉංජිනේරු) විසින් මෙම පෞද්ගලික ආයතනවලට රථගාල්වල මුදල් අයකිරීමට අවස්ථාව සලසා දී තිබූ බවට නිරීක්ෂණය විය.

3.3.16.5 මෙම පෞද්ගලික ආයතන එකොළහ 2021 දෙසැම්බර් 31 දිනට රථවාහන ගාල් පවත්වාගෙනයාමේ ගාස්තු රු.මිලියන 85.1ක් ගෙවීම් පැහැරහැර තිබියදී 2021

දෙසැම්බර් 31 දින ගිවිසුම් කාලය අවසන් වීමෙන් පසුව නිත්‍යානුකූල නොවන අයුරින් තවදුරටත් රථගාල් ගාස්තු අයකරගැනීමට ඉඩහැර තිබූ බවට නිරීක්ෂණය වූ අතර 2022 මාර්තු 01 දිනට මෙම ශේෂය රු.මිලියන 92.5ක් දක්වා වර්ධනය වී ඇති බවද **(ඇමුණුම 07)** නිරීක්ෂණය විය.

3.3.17 නොරිස් කැනල් රථගාල

-----------------------------

3.3.17.1 ඒ.ආර්. එන්ටර්ප්‍රයිසස් ආයතනය පවත්වාගෙන යන නොරිස් කැනල් රථගාලේ ආසිරි සෙන්ට්‍රල් පෞද්ගලික රෝහල ඉදිරි පිට කොටසේ වාහන 41ක් පමණක් මාර්ගයට තිරස් වන පරිදි ගාල් කල යුතු බවට ගිවිසුම්ගත වාහන ගාල් සැලැස්මේ දක්වා තිබුණද, සිදු කළ භෞතික පරීක්ෂාවේදී නගර සභාව විසින් මාර්ගය අවහිර වන පරිදි, වාහන 70කට අධික ප්‍රමාණයක් ගාල් කල හැකි පරිදි වාහන නැවැත්වීමේ මං සලකුණු ආනත හැඩයකින්(Angle Shape) ඇඳ ඇති බව නිරීක්ෂණය විය.

3.3.17.2 එසේ තිබියදී, රථගාල පවත්වාගෙන යන ඒ.ආර්. එන්ටර්ප්‍රයිසස් පෞද්ගලික ආයතනයේ සේවකයින් ආසිරි සෙන්ට්‍රල් පෞද්ගලික රෝහල ඉදිරිපිට එම කොටස තුළ මාර්ගය අවහිර වන පරිදි මාර්ගයට සිරස් වන පරිදි රථවාහන ගාල් කිරීමට කටයුතු කර ඇති බව නිරීක්ෂණය විය. මේ හේතුවෙන් තිරස් අතට වාහන 41 ක් පමණක් ගාල් කල හැකි බවට තක්සේරු කර ගිවිසුම් ගත වී ඇති කොටස තුල වාහන 82 ක් පමණ ගාල් කිරීමට පෞද්ගලික ආයතනයේ සේවකයින් කටයුතු කර ඇති බව නිරීක්ෂණය විය. එය මාර්ගයේ ගමනාගමනයට බාධාවක් වී ඇති බවද නිරීක්ෂණය කෙරේ.

3.3.18 බොරැල්ල මංසන්ධියේ සිට මරදාන දක්වා වූ මාර්ගය දෙපස පිහිටි රථගාල

---------------------------------------------------------------------------------

3.3.18.1 බොරැල්ල මංසන්ධියේ සිට මරදාන දක්වා වූ කි.මී.2ක් පමණ වූ මාර්ගය දෙපස වාහන 118ක් ගාල් කල හැකි තනි රථගාලක් ලෙස සලකා K Two Logistics services නමැති පෞද්ගලික ආයතනයට 2019 දෙසැම්බර් 31 සිට 2021 දෙසැම්බර් 31 දක්වා ටෙන්ඩර් ලබා දී තිබූ බවට නිරීක්ෂණය විය.

3.3.18.2 ගිවිසුමෙහි බොරැල්ල සිට මරදාන දක්වා කි.මී.2ක් දක්වා මාර්ගය දෙපස ප්‍රදේශයේ කොටස් 5ක වාහන 118ක් ගාල්කල හැකි බවට ආදායම් තක්සේරු කර මෙම ආයතනයට ලබා දී ඇතත් ටෙන්ඩර් ලබා දීමට පෙර වාහන 118ක් ගාල් කල හැකි කොටස් පිහිටි ස්ථාන මොනවාද යන්න නිශ්චිතව දක්වා නොතිබූ අතර ගාල් කල හැකි ස්ථාන සිතියම්ගත නොකර මෙම ටෙන්ඩරය ලබා දී තිබූ බවට නිරීක්ෂණය විය.

3.3.18.3 විගණනය සිදුකල භෞතික පරික්ෂාවේදී ස්ථාන තුනක දැන්වීම් පුවරු තුනක් පමණක් දක්නට ලැබුණු අතර වාහන 118ක් ගාල්කල හැකි ස්ථාන මොනවාද යන්න මහ නගර සභාව විසින් ලකුණු කර තිබූ බවට නිරීක්ෂණය නොවිය.

3.3.18.4 මෙම තත්වය තුල බොරැල්ල මංසන්ධියේ සිට මරදාන දක්වා වූ කි.මී.2ක් දක්වා වූ මාර්ගය දෙපස කවර ස්ථානයක වුවද නවතනු ලබන වාහන වලින් මුදල් අය කිරීමේ හැකියාව පවතින හෙයින් මුදල් අයකරන පුද්ගලයින් යොදා මෙලෙස සෑම ස්ථානයකින්ම වාහන නැවැත්වීමේ ගාස්තු අයකරන බවට නිරීක්ෂණය වූ අතර මේ නිසා මහජනතාව අසීරුතාවයට පත්වන බවට නිරීක්ෂණය විය.

3.3.18.5 තවද, මෙම මාර්ගයේ වාහන ගාල් කිරීම කල යුතු ස්ථාන මොනවාද යන්න නිශ්චිතව දක්වා බිම්කඩවල් වෙන්කර දී නොමැති බැවින් බොරැල්ල මංසන්ධියේ සිට මරදාන දක්වා මහා මාර්ගයේ බස් මංතීරු තුල ගාස්තු අයකරමින් රථවාහන ගාල් කිරීම නිසා සතියේ කාර්යාලීය දිනවල සවස් කාලය තුල පවතින දැඩි මාර්ග තදබදයට හේතුවක්ව ඇති බවට නිරීක්ෂණය කෙරේ.

3.3.18.6 ඉහත 3.3.16 ඡේදයේ සඳහන් නිරීක්ෂණයේ දක්වා ඇති පරිදි බොරැල්ල මංසන්ධියේ සිට මරදාන දක්වා වූ මාර්ගය දෙපස පිහිටි රථගාලේ ගාස්තු අය කිරීමේ කොන්ත්‍රාත් කාලසීමාව ගිවිසුම් ප්‍රකාරව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වී තිබූ අතර නැවත ටෙන්ඩර් ප්‍රදානය කරන තුරු එම රථගාලෙහි ගාස්තු අය කිරීමට ඉඩ ලබාදෙන ලෙස K Two logistics services ආයතනය විසින් 2022 ජනවාරි 3 දින සිදුකල ඉල්ලීම පදනම් කරගෙන කොළඹ නගර සභාවේ රථ වාහන සැලසුම් හා මාර්ග ආරක්ෂණ අංශයේ නිලධාරීන් විසින් සභාවේ අනුමැතිය රහිතව අවසන් වූ කොන්ත්‍රාත්තුවේ කොන්දේසි අනුවම කොළඹ මරදාන පාරෙහි රථවාහන නැවතුම් ගාස්තු අය කිරීමට K Two logistics services ආයතනයට ඉඩ ලබා දී තිබූ අතර, ඒ සඳහා සභාවේ විධිමත් අනුමැතියක් ලබා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

4. රථ වාහන පාලිකාවන් යොදා රථවාහන ගාල් කළමණාකරනය

---

4.1 2006 ජනවාරි 06 දිනැති අංක DMS/PC & LG/04(11) දරණ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය ප්‍රකාරව රථවාහන පාලක තනතුරු 258 ක් අනුමත කර තිබී ඇති අතර, බස්නාහිර පළාත් පාලන කොමසාරිස්ගේ 2013 ජනවාරි 15 දිනැති අංක GD/02G/පොදු/2013 දරණ ලිපිය මගින් එම තනතුර, සේවයේ නියුතු අයට පෞද්ගලික වන සේ තනතුරු 96ක් දක්වා අඩු කරමින් අනුමත කර තිබුණි. 2017 වර්ෂයේදී එම තනතුරු සංඛ්‍යාව 71 දක්වා තව දුරටත් අඩු කරමින් කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර තිබූ අතර, සිටින නිලධාරීන් විශ්‍රාම යාමත් සමඟ 2020 වර්ෂය වන විට රථවාහන පාලක/ පාලිකාවන් ගණන 23ක්ද 2021.12.31 දිනට පාලිකාවන් 9ක් දක්වාද අඩු වී තිබුණි.

4.2 විගණනය සිදුකල 2021.12.31 දින වන විට රථවාහන පාලිකාවන් 09 දෙනෙකු විසින් **ඇමුණුම 08** පරිදි නගරසභා පොදු වෙළඳපලවල් ආශ්‍රිත ස්ථානවල වාහන ගාල් 5ක් හා තවත් ස්ථාන 3ක රථවාහන නැවතුම් ගාස්තු අයකරමින් තිබුණි.

4.3 2020 ජනවාරි සිට 2020 දෙසැම්බර් 31 දක්වා කාලච්ඡේදය තුල රථවාහන පාලිකාවන් මඟින් රථවාහන නැවැත්වීමේ ගාස්තු අයකිරීමට වෙන්කර ඇති නැවතුම් ස්ථාන, එම ස්ථානයන්හි ධාරිතාවයන් හා රථවාහන පාලිකාවන් විසින් අයකර නගර සභාව වෙත ලබා දී ඇති ආදායම් විස්තර අනුව රථ වාහන පාලක/පාලිකා වන් මඟින් ගාස්තු අයකිරීම සඳහා වෙන්කර තිබූ වාහන ගාල් කිරීමේ ස්ථාන 08 හි මෝටර් රථ 348ක්, ලොරි රථ 113ක්, ත්‍රිරෝද 102ක්, යතුරු පැදි 161ක්ද ලෙස වාහන 724ක් එකවර ගාල් කිරීම සඳහා ඉඩ වෙන්කර තිබූ අතර 2020 වර්ෂය සඳහා වාහන නැවැත්වීමේ ගාස්තු ලෙස පාලක/පාලිකාවන් 23 දෙනෙකු විසින් රු. 8,385,410 ක් නගර සභාවට රැස්කර දී තිබුණි.

4.4 පහත කරුණු නිරීක්ෂණය විය.

4.4.1 රථ ගාල් ආදායම වාර්තා කිරීමේ කටයුතු ගිණුම් අංශයේ සහභාගිත්වයකින් තොරව රථවාහන පරිපාලන දෙපාර්තමේන්තුවේම කළමණාකරන සේවා නිලධාරියෙකු මඟින්ම දිගු කලක සිට සිදු කර තිබිණි. මෙම තත්වය තුල රථගාල් පරිපාලන කටයුතු, රථගාල් ආදායම් එකතු කිරීම හා රථගාල් ආදායම් වාර්ථා කිරීම එකම අංශයකින් සිදු වීම නිසා එහි ප්‍රමාණවත් වැඩ බෙදී යාමක් නොමැති වීම හේතුවෙන් වංචා සිදු වීමේ අවදානමක් ඇති බව නිරීක්ෂණය විය.

4.4.2 රාජකාරී පවරා තිබූ පාලක/ පාලිකාවන් 23 දෙනා විසින් වාහන අංගන 08න් අවම වශයෙන් උපයා දිය යුතුව තිබූ සාමාන්‍ය මාසික රථ වාහන නැවතුම් ගාස්තු දළ ආදායම (පැයකට වාහනය බැගින් දිනකට පැය 8ක් ලෙස මසකට දින 25ක් ගාස්තු අය කලේනම්) රු. 5,602,000 ක් පමණ විය යුතු වුවත් ඔවුන් රැස්කර දුන් සාමාන්‍ය මාසික ගාස්තු ආදායම රු.1,087,344 ක් වන බැවින්, අදාල කාලච්ඡේදය තුල දළ වශයෙන් මාසිකව රු.4,514,656 ක් පමණ ආදායමක් නගර සභාවට අහිමි වී තිබූ බව නිරීක්ෂණය විය. **(ඇමුණුම 09)**

4.4.3 පහත සඳහන් පරිදි ප්‍රමාණවත් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් නොයෙදීම හා පවත්නා අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් නිසි පරිදි ක්‍රියාත්මක නොවීම මත පාලක/පාලිකාවන්ගේ ගාස්තු ආදායම නගර සභාවට අයකර ගැනීමට නොහැකිව තිබූ බවට නිරීක්ෂණය විය.

4.4.3.1 රථ වාහන පාලක/පාලිකාවන් නිසි පරිදි අධීක්ෂණය කිරීමේ ක්‍රමවේදයක් නගර සභාව විසින් ක්‍රියාත්මක කර නොතිබීම. උදාහරණ ලෙස ගාල් කෙරෙන සෑම වාහනයකින්ම ප්‍රවේශපත්‍ර නිකුත් කර ගාස්තු අයකෙරෙන බව සහතික නොවීම, කාලීනව රථගාල්වල ප්‍රශස්ත ආදායම

තක්සේරු නොකිරීම. මේ හේතුව නිසා රථගාලකින් අයවිය යුතු ප්‍රශස්ත ආදායමට වඩා අඩු වටිනාකමක් නගර සභාව වෙත ගෙවීම් කිරීමට අවස්ථාව සැලසී තිබුණි.

4.4.3.2 අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන ක්‍රියාත්මක නොවීම

I. 08 හා 18 වන වගන්ති ප්‍රකාරව ගාල් කිරීමේ අරමුණින් තොරව නැවතුම්පල බිම් කඩවල් භාවිතා කිරීම නොකල යුතු බව දක්වා තිබුණද, නගර සභා බල ප්‍රදේශ තුල රථවාහන පාලිකාවන් විසින් ගාස්තු අයකරන නාගරික සුපිරි වෙළඳසැල් ආශ්‍රිතව ව්‍යාපාරික අවශ්‍යතා වෙනුවෙන් අදාල භූමින් පරිහරණය කෙරෙන අවස්ථා හඳුනා ගෙන තිබූ අතර, ඒ පිලිබඳව නෛතික ක්‍රියා මාර්ග ගැනීමට නගර සභාව කටයුතු නොකිරීම.

II. 09 වන වගන්තිය ප්‍රකාරව මෝටර් වාහනයක් වාහන නැවැත්වීමේ බිම් කඩක ගාල් කිරීම සඳහා නගර සභාවේ බලය ලත් පාර්ශවයක් විසින් නිකුත් කරන ලද අදාල ගාස්තු ගෙවා ලබා ගත් අවසර පත්‍රයක් තිබීම අනිවාර්ය වුවද, නාගරික සුපිරි වෙළඳසැල් ආශ්‍රිතව පාලිකාවන් විසින් මුදල් එකතු කරන රථ වාහන ගාල්වල කිසිඳු ගෙවීමකින් තොරව වෙළඳසැල් හිමියන්ට අයත් වාහන ප්‍රසිද්ධියේ දෛනිකව ගාල් කෙරෙන බව නිරීක්ෂණය වුවද නගර සභාවේ නිලධාරීන් ඒ පිලිබඳව නෛතික ක්‍රියා මාර්ග නොගැනීම.

5. ටිකට්පත් නිකුත් කරන ස්වයංක්‍රිය යන්ත්‍ර යොදාගනිමින් (මනුගත කිරීම) රථවාහන ගාල් කිරීමේ ගාස්තු අය කිරීම

---

නව තාක්ෂණය හඳුන්වා දෙමින් මහජනතාවට කාර්යක්ෂම සේවාවක් ලබා දීම සහ දිගු කාලීනව රථවාහන ගාස්තු ආදායම් වැඩි කරගැනීමේ අරමුණු සහිතව ස්වයංක්‍රිය යන්ත්‍ර භාවිතයෙන් ගාස්තු අය කරමින් රථ වාහන ගාල් කළමණාකරනය කිරීමේ ක්‍රමවේදය 2015 වර්ෂයේදී නියමු ව්‍යාපෘතියක් ලෙස හඳුන්වා දී තිබූ අතර, ඒ අනුව වාහන 1,426ක් ගාල් කල හැකි ඩුප්ලිකේෂන් පාර,ගාලු පාර හා ඒ ආශ්‍රිත අතුරු මාර්ග ආශ්‍රිත රථගාල්වල ස්වයංක්‍රිය යන්ත්‍ර භාවිතයෙන් ගාල් කිරීමේ ගාස්තු අය කිරීමේ ක්‍රමවේදයක් ස්ථාපිත කර 2015 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා පවත්වාගෙන යාමට ටෙනාගා කාර් පාර්ක්ස් (පුද්) සමාගම සමඟ ගිවිසුම්ගත වී තිබුණි.

5.1 2015 ජූනි 01 දින පැවති කොළඹ නගර සභාවෙහි මෙහෙයුම් කමිටු රැස්වීමේදී ගනු ලැබූ තීරණයකට අනුව මනුගත කිරීමේ ක්‍රමයකට (ස්වයංක්‍රිය යන්ත්‍ර භාවිතයෙන්) රථවාහන ගාල් කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වා දීමේ නියමු පියවරක් ලෙස ගාලු පාර සහ ඩුප්ලිකේෂන් පාර සඳහා වසර 8ක කාලච්ඡේදයකට කොන්ත්‍රාත්කරුවෙකු තෝරා ගැනීම සඳහා 2015 ජූනි 26 දින ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් ඩේලි නිවුස් පුවත්පතෙහි දැන්වීමක් පල කරමින් ලංසු කැඳවා තිබුණි.

5.2 එම පුවත්පත් දැන්වීමට අනුව ආයතන 13ක් ලංසු ලියවිලි ලබාගෙන තිබුණි. ලංසු ඉදිරිපත් කිරීමට ලබා දී තිබූ සති 03ක කාලය ප්‍රමාණවත් නොවන බව දන්වමින් ලංසු ලියවිලි ලබාගත්

ආයතන අතුරින් ආයතන 4ක් සිදුකල ඉල්ලීම් පදනම් කරගෙන ලංසු කැඳවීමේදි නියම කර තිබූ ලංසු ලියවිලි බාර ගැනීමේ අවසාන දිනය 2015 ජූලි 17 සිට 2015 අගෝස්තු 07 දින දක්වා දීර්ඝ කල බව ඩේලි නිවුස් පුවත්පතෙහි 2015 ජූලි 14 දින දැන්වීමක් පල කරමින් දන්වා තිබුණි.

5.3 උක්ත දින දීර්ඝ කිරීම සිදුකර තිබියදී, ලංසු කැඳවීම අවලංගු කිරීමක් සිදු නොකර නව දැන්වීමක් 2015 ජූලි 17 දින සිංහල පුවත්පත් තුනක පල කර තිබූ අතර, මෙම දැන්වීමට අනුව කිසිදු ආයතනයක් අලුතින් ලංසු ලියවිලි ලබාගෙන නොතිබුණි.

5.4 2015 ජුනි 26 දින පුවත්පත් දැන්වීමට ප්‍රතිචාරීව ආයතන 13ක් ලංසු ලියවිලි ලබාගෙන තිබූ අතර ඒ අතුරින් ආයතන 8ක් (Access International, Richardson Outdoor (Pvt) Ltd, Tenaga Car Parks (Pvt) Ltd, Sunpower Systems (Pvt) Ltd, Jat Holdings, Metro Car Park (Pvt) Ltd, Ceynox Networks (Pvt) Ltd, Richardson Projects (Pvt) Ltd යන) පූර්ව ලංසු කැඳවීමේ රැස්වීම් සඳහා සහභාගි වී තිබුනද, ආයතන 04ක් පමණක් (Sunpower Systems (Pvt) Ltd, Jat Holdings, Richardson Outdoor (Pvt) Ltd සහ Tenaga Car Parks (Pvt) Ltd යන) මිල ගණන් ඉදිරිපත් කර තිබුණි.

5.5 ඉහත ලංසු ඇගයීම අදියර දෙකකින් සිදුකර ඇති අතර එහිදී තාක්ෂණික ඇගයීම මූලිකව සිදුකර එයට සාර්ථකව ප්‍රතිචාර දක්වන ලංසුවල පමණක් මිල යෝජනාව ඇගයීමට ලක්කර තිබුණි.

ලංසුකරුවන්ගේ සුදුසුකම් ඇගයීමේදී පහත පරිදි නිර්ණායක 5ක් පදනම් කරගෙන ලකුණු ලබා දී තිබුණි.

| | නිර්ණායකය | වෙන්කර තිබූ ලකුණු |
|---|---|---|
| | ---------------- | -------------------- |
| 1. | ඉල්ලුම්කරුගේ පලපුරුද්ද | 20 |
| 2. | පසුගිය වසර 3හි සාමාන්‍ය වාර්ෂික පිරිවැටුම | 20 |
| 3. | යෝජනා කරන ලද යන්ත්‍රය හා ප්‍රදර්ශනය<br>- යන්ත්‍ර ප්‍රදර්ශනය හා ගෙවීම පිළිබඳ නිශ්පාදකයාගේ පලපුරුද්ද (ල.8)<br>-යෝජනා කරන යන්ත්‍රයේ ආයු කාලය (ල.6)<br>-මුදල් නෝට්ටු හා කාසි මඟින් ගාල් කිරීමේ ගාස්තු ගෙවීමේ හැකියාව (ල.5)<br>-යන්ත්‍ර මඟින් ගාල් කිරීමේ ගාස්තු ගෙවීමේදී ඉල්ලුම්කරු ඉදිරිපත් කරන වෙනත් විශ්වසනීය ක්‍රමවේදයක් (ල.6) | 25 |
| 4. | ක්‍රියාත්මක කිරීමේ වැඩසටහන<br>-යෝජිත කළමණාකරුගේ පලපුරුද්ද, සේවයේ යෙදවීමට බලාපොරොත්තු වන සේවකයින් ප්‍රමාණය (ල.5)<br>-ගෙවිය යුතු ගාල් කිරීමේ ගාස්තු නොගෙවන වාහන හඳුනා ගැනීමේ | 15 |

ක්‍රමවේදයන් හා තාක්ෂණවේදයන් (ල.10)

5. ඉල්ලුම්කරු යෝජනා කරන වෙනත් නව සේවාවන්/ආදායම් මාර්ග හා නව මැදිහත්වීම් 20

5.6 මිල ගණන් ඉදිරිපත් කල ආයතන 4 අතුරින් සුදුසුකම් ඇගයීමේ අදියරේදි ලකුණු 60ක් ලබා නොගැනීම යන පදනම මත Sunpower Systems (Pvt) Ltd සහ Jat Holdings යන ආයතන දෙකෙහි ලංසු සාමාන්‍ය ප්‍රතිචාරාත්මක නොවන ලංසු ලෙස සලකා ඉවත් කර තිබුණි. ඉතිරි Richardson Outdoor (Pvt) Ltd සහ Tenaga Car Parks (Pvt) Ltd ආයතන දෙකෙහි මිල යෝජනා ඇගයීමෙන් අනතුරුව Tenaga Car Parks (Pvt) Ltd ආයතනය කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා තෝරාගෙන තිබුණි.

5.7 ඒ අනුව Tenaga Car Parks (Pvt) Ltd වෙත 2015 නොවැම්බර් 12 දින කොන්ත්‍රාත් පිරිනැමීමේ ලිපිය ලබා දී තිබූ අතර 2016 මාර්තු 28 දින සිට 2023 දෙසැම්බර් 31 දක්වා ස්වයංක්‍රිය යන්ත්‍ර භාවිතයෙන් රථගාල් කළමණාකරනය කිරීමට 53/2016 දරණ ගිවිසුම අත්සන් තබා තිබුණි.

5.8 උක්ත ගිවිසුමෙහි පහත කොන්දේසි ඇතුලත් කර තිබුණි

5.8.1 9(a) වගන්තිය පරිදි ආයතනය විසින් පහත පරිදි කුලි මුදල් මාසිකව නගර සභාවට ගෙවිය යුතුය.

| කාලච්ඡේදය | මාසික කුලිය |
|---|---|
| පළමු මාස 6 | • මාසිකව රු.1,500,000.00 + බදු |
| මාස 6 සිට මාස 30 දක්වා | • මාසිකව රථවාහන ගාල් කිරීමේ ආදායමෙන් 40% + බදු<br>• මාසිකව මුළු දඩ මුදලින් ලැබෙන ආදායමෙන් 48% + බදු<br>• මාසිකව අනෙකුත් මුළු ආදායමෙන් 30% + බදු |
| මාස 30න් පසුව | • මාසික අවම බදු මුදල රු.3,468,875.20 + බදු හෝ රථවාහන ගාල් කිරීමේ මුළු ආදායමෙන් 40% යන දෙකෙන් වැඩි ආදායම<br>• මාසිකව මුළු දඩ මුදලින් ලැබෙන ආදායමෙන් 48% + බදු<br>• මාසිකව අනෙකුත් මුළු ආදායමෙන් 30% + බදු |

5.8.2 9(c) වගන්තිය අනුව මාසික කුලිය අදාල මාසයට පසු මාසයෙහි 15 වන දින හෝ ඊට පෙර ගෙවිය යුතුය.

5.8.3 9(d) වගන්තිය අනුව එසේ නොගෙවන අවස්ථාවලදී මාසිකව ගෙවිය යුතු මුදලින් 2%ක මුදලක් ප්‍රමාද ගාස්තු ලෙස අය කල යුතුය. අධිභාර, දඩ සහ සභාවට ගෙවිය යුතු අනෙකුත්

ගෙවීම් සමඟ හිඟ මාසික කුලිය, ගැලපීම් සිදු කරන ලද මාස දෙකක අවම මාසික කුලියට සමාන හෝ ඉක්මවා යන අවස්ථාවලදී කිසිදු පෙර දැනුම් දීමකින් තොරව කොන්ත්‍රාත්තුව අත්හිටුවීමට සභාවට බලය ඇත.

5.9 ටෙනාගා කාර් පාර්ක්ස් සමාගම සමඟ එළඹි 53/2016 ගිවිසුමෙහි ඔවුන් විසින් ස්ථාපනය කල යුතු ස්වයංක්‍රිය යන්ත්‍ර සංඛ්‍යාව දක්වා නොතිබූ අතර ගමනාගමන, නිර්මාණ සහ මාර්ග ආරක්ෂණ අංශයෙන් සිදු කරගන්නා ලද පැහැදිලි කිරීම්වලට අනුව යන්ත්‍ර 100ක් ස්ථාපිත කිරීමට කටයුතු කල බවත්, එම යන්ත්‍රවලින් ගිවිසුම්ගත ප්‍රදේශය ආවරණය නොවන බැවින් ඉතිරි ප්‍රදේශවල ගාස්තු එකතු කිරීම සඳහා Hand held device භාවිතයට ඉඩ ලබා දී තිබූ බවත් අනාවරණය විය.

5.10 මෙලෙස ස්ථාපිත ස්වයංක්‍රිය යන්ත්‍ර අක්‍රිය වීමක් පිළිබඳව 2020 මාර්තු මාසය වන විට නගර සභාවේ රථවාහන අංශය දැනුවත් වී තිබූ අතර මේ සම්බන්ධව 2020 ඔක්තෝබර් 21 දින සිට 2021 ජනවාරි 25 දක්වා එම අංශය විසින් සිදුකරන ලද පරීක්ෂා කිරීම්වලට අනුව යන්ත්‍ර 50ක් අක්‍රිය තත්වයේ පවතින බවත්, යන්ත්‍ර 3ක් භෞතිකව නොතිබූ බවත් වාර්තා කර තිබුණි.

5.11 ටෙනාගා කාර් පාර්ක්ස් සමාගම 2017 සිට දිගින් දිගටම ගෙවීම් පැහැර හැරීම හේතුවෙන් 2021.03.09 දින රැස්වූ මුදල් කාරක සභාවේ තීරණයට අනුව 2021 අප්‍රේල් 07 දින කොන්ත්‍රාත්තුව අවසන් කිරීමට කටයුතු කර තිබුණි.

5.12 මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

5.12.1 ලංසු කැඳවීමේ දැන්වීම 2015 ජුනි 26 දින ඉංග්‍රීසි පුවත්පතක පමණක් පල කිරීම හා දෙවන වරට 2015 ජූලි 17 දින පලකල දැන්වීම සිංහල පුවත්පත් තුනක පමණක් පල කිරීම තුලින් සුදුසුකම්ලත් උනන්දුවක් දක්වන පාර්ශවයන්ට ප්‍රසම්පාදනයට සහභාගි වීම සඳහා සාධාරණ, සමාන හා උපරිම අවස්ථා ලබා දිය යුතුය යන ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1 (ඇ) වගන්තිය යටතේ සඳහන් ප්‍රසම්පාදනයේ මූලික අරමුණක් කඩ වී ඇති බව නිරීක්ෂණය කෙරේ.

5.12.2 සුදුසුකම් ඇගයීම් පත්‍රයෙහි අංක 5 නිර්ණායකය ලෙස ලංසුකරු විසින් ඉදිරිපත් කරන වෙනත් ඕනෑම සේවාවක්, ආදායම් ක්‍රමයක් හා නවෝත්පාදන සඳහා ලකුණු 20ක් වෙන්කර තිබුනද, එම කරුණු ඇගයීමට ලක්කරන නිර්ණායක ලංසු ලියවිලිවල පූර්වයෙහි සඳහන් කර නොතිබූ නමුත් සුදුසුකම් ඇගයීමේ අදියරේදී ඇගයීමේ නිර්ණායක ලෙස දැන්වීම්, ජංගම ගෙවීමේ පද්ධතිය, ස්වයංක්‍රීයව වලංගු කල හැකි දඩය, පෙර ගෙවීම් කාඩ් සඳහා ජංගම රීලෝඩ් කිරීම, ටච් කාඩ් රීලෝඩ්, එන්වයරමෙන්ටලි ග්‍රීන් වෝටර්ලස් කාර් වොෂ් ලෙස අනු කොටස්වලට බෙදා ලකුණු ලබා දී තිබුණි. එබැවින් ලංසු ලේඛනවල ඇතුලත් නොවූ අනු කොටස් ලංසු ඇගයීමට ලක් කිරීමේදී යොදා ගැනීම තුලින් යම් ලංසුකරුවෙකුට වාසියක් හා තවත් ලංසුකරුවෙකුට අවාසියක් සිදුවිය හැකි තත්වයක් විගණනයට නිරීක්ෂණය වූ අතර මෙය රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.2.1 (අ) හා 5.3.20 (ආ) වගන්ති උල්ලංඝනය කිරීමක් බවද නිරීක්ෂණය විය.

5.12.3 සුදුසුකම් ඇගයීමේ අදියරේදී තාක්ෂණික යෝජනාවට ලකුණු 60ක් ලබා නොගැනීම යන පදනම මත Sunpower Systems (Pvt) Ltd සහ Jat Holdings යන ආයතනවල ලංසු සාමාන්‍ය ප්‍රතිචාරාත්මක නොවන ලංසු ලෙස සලකා මිල යෝජනා ඇගයීමකින් තොරව ලංසු ඇගයීමේ ක්‍රියාවලියෙන් ඉවත් කර තිබුනද, එවැනි කොන්දේසියක් ලංසු ලියවිලිවල සඳහන් කර නොතිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය.

5.12.4 වෙනාගා කාර් පාර්ක්ස් සමාගම 2016 ජනවාරි 1දින සිට වාහන ගාල් කිරීමේ ගාස්තු අය කිරීම ආරම්භ කර තිබූ අතර 2016 නොවැම්බර් සිට දිගින් දිගටම ගෙවීම් පැහැර හැරීම හේතුවෙන් 2021 අප්‍රේල් 30 දින වන විට නගර සභාවට ගෙවිය යුතු ගාස්තු රු.109,254,581ක් තිබූ බවට නිරීක්ෂණය විය.

5.12.5 කොන්දේසි 9 (d) ප්‍රකාරව කොන්ත්‍රාත්කරු නිසි පරිදි ගෙවීම් නොකිරීමේදී ගිවිසුම අත්හිටුවීමට නගර සභාවට කටයුතු කල හැකි වුවද, වෙනාගා කාර් පාර්ක්ස් සමාගම 2016 නොවැම්බර් මාසයේ සිටම නිසි පරිදි ගෙවීම් කිරීම පැහැර හැර තිබුනද 2021 අප්‍රේල් 07 වන තෙක් ගිවිසුම අත්හිටුවීමට නගර සභාව කටයුතු කර නොතිබූ බව නිරීක්ෂණය විය.

5.12.6 වෙනාගා කාර් පාර්ක්ස් සමාගම විසින් ගෙවීම් පැහැර හරින ලද රු.109,254,581ක මුදල අය කර ගැනීමට නීති ක්‍රියාමාර්ග ගැනීමට කොළඹ මහ නගර සභාව මේ දක්වා අපොහොසත් වී ඇති බව නිරීක්ෂණය විය.

5.12.7 වෙනාගා කාර් පාර්ක් සමාගමෙහි කොන්ත්‍රාත් ගිවිසුම අවසන් කිරීමෙන් පසු මේ දක්වා වසරකට ආසන්න කාලයක් ගත වුවද එම සමාගම විසින් ගාස්තු අය කිරීම් සිදුකල රථගාල් වල ආදායම් අය කර ගැනීම සඳහා විකල්ප ක්‍රමවේදයක් මේ වන තෙක් නගර සභාව විසින් ක්‍රියාත්මක කර නොතිබූ බැවින් නගර සභාවට හිමි විය යුතු ඇස්තමේන්තුගත දල ආදායම රු. 66,724,488ක් (කොන්ත්‍රාත් සඳහා අවම මාසික රථගාල් ගාස්තු තිරණය කිරීමේ ක්‍රමවේදය - **ඇමුණුම 10**) සභාවට අහිමි වී බව නිරීක්ෂණය විය.

6. නාගරික මන්ත්‍රීවරුන් රථවාහන ගාල් කිරීමේ ඉඩකඩ වෙන් කර ගැනීම

--------------------------------------------------------------------------------

කොළඹ මහ නගර සභාවේ මන්ත්‍රීවරුන්ගේ වාහන ඔවුන්ගේ කාර්යාල ඉදිරිපිට ගාස්තු අය කිරීමකින් තොරව ගාල් කිරීම සඳහා අවසර දීම සභාවේ පරිචයක් ලෙස පවත්වාගෙන ගොස් තිබුණි. ඒ අනුව වත්මන් සභාව තුල නාගරික මන්ත්‍රීවරුන් 119 දෙනා අතුරින් නාගරික මන්ත්‍රීවරුන් 9 දෙනෙකු හැර ඉතිරි මන්ත්‍රීවරුන් 110 දෙනා තමාගේ කාර්යාලය ඉදිරිපස තම පෞද්ගලික රථය ගාල් කර ගැනීම සඳහා මහ නගර සභාවට අයත් ගාස්තු අය කර රථවාහන ගාල් කෙරෙන ස්ථානවලින් 2.4m*4.8m ප්‍රමාණයේ ඉඩක් වෙන් කරගෙන තිබූ අතර (**ඇමුණුම 11**) , මේ සම්බන්ධයෙන් පහත කරුණු අනාවරණය විය.

6.1 මන්ත්‍රීවරුන්ගේ කාර්යාල පිහිටි ලිපිනය සඳහන් කරමින් තම කාර්යාලය ඉදිරිපස තම රථය ගාල් කිරීම සඳහා ඉඩ වෙන්කර දෙන ලෙස කල ඉල්ලීම් ලිපිය පදනම් කරගෙන සභාව විසින් ඊට අනුමැතිය ලබා දී තිබුණි.

6.2 සභාවේ අනුමැතියෙන් නගර සභාවේ තාක්ෂණික නිලධාරින් විසින් එම ස්ථාන භෞතිකව පරික්ෂා කර වාර්තාවක් ලබා දීමෙන් පසු ගමනාගමනය, මහාමාර්ග හා ප්‍රවාහනය පිළිබඳ ස්ථාවර කමිටු අනුමැතියකින් අදාල ස්ථාන මන්ත්‍රීවරුන් වෙත වෙන්කර දී තිබුණි.

6.3 තමන්ගේ කාර්යාල පවත්වාගෙන යන බවට බිම්කඩවල් වෙන්කරගෙන තිබූ මන්ත්‍රීවරුන් 110 දෙනා අතරින් මන්ත්‍රීවරුන් 60 දෙනෙකු කොළඹ 11 ලිපිනයන්හි කාර්යාල පවත්වාගෙන යන බවත් මන්ත්‍රීවරුන් 13 දෙනෙකු කොළඹ 12 ලිපිනයන්හි කාර්යාල පවත්වා ගෙන යන බවටත් ඉතිරි මන්ත්‍රීවරු 37 දෙනා කොළඹ 01,02,03,04,05,06,07,10,13 ලිපිනයන්හි කාර්යාල පවත්වා ගෙන යන බවට සඳහන් කර වාහනය නවතා තැබීම සඳහා බිම්කඩ වෙන්කර තිබුණි.(ඇමුණුම 12)

6.4 මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

6.4.1 නාගරික මන්ත්‍රීවරුන්ට රථගාල් වෙන් කිරීමට අදාලව නගර සභාව පවත්වාගෙන යන ලිපිගොනු පරික්ෂාවේදී මන්ත්‍රීවරුන් අදාල ස්ථානවල තම කාර්යාල පවත්වාගෙන යන බව තහවුරු කර ගැනීම සඳහා එම ලිපිනයන්හි සඳහන් ස්ථානවල හිමිකරුවන් සමඟ ඇති කරගත් බදු ගිවිසුම් දිවුරුම් ප්‍රකාශ හෝ වෙනයම් ආකාරයක නෛතික ලියවිල්ලක් හෝ කිසිදු තොරතුරක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

6.4.2 මන්ත්‍රීවරුන් භාවිතා කරන ලිපි ශීර්ෂයේ අදාල මන්ත්‍රීවරුන්ගේ ලිපිනයන් දක්වා ඇති අතර බොහොමයක් මන්ත්‍රීවරුන් වාහන ගාල් කිරීමේ පහසුකම ඉල්ලා සිටින ස්ථානයේ ලිපිනයන් ලිපි ශීර්ෂවල සඳහන් ලිපිනයන් සමග නොගැලපෙන බව නිරීක්ෂණය විය.

6.4.3 විගණනය විසින් සිදුකල පරික්ෂාවේදී මන්ත්‍රීවරු 51 දෙනෙකු තම වාහනය ගාල් කිරීම සඳහා ඉඩ වෙන්කරගත් ස්ථානයට අදාලව තම කාර්යාලය පවත්වාගෙන යන බවට සඳහන් ලිපිනයන්හි වෙනත් පුද්ගලයින්/ ආයතන විසින් ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යන ස්ථානයන් බව නිරීක්ෂණය විය.

6.4.3.1 නාගරික මන්ත්‍රීවරයෙක් විසින් තම කාර්යාලය පවත්වාගෙන යන බවට වෙන්කරවාගෙන තිබූ අංක 56, කෙයිසර් වීදිය, කොළඹ 11 ලිපිනයෙහි ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යන New Tone ආයතනයෙහි හිමිකරු විසින් රථ වාහන අංශයෙහි අධ්‍යක්ෂ ඉංජිනේරු වෙත ලිපියක් යොමු කරමින් තම ව්‍යාපාර ස්ථානය ඉදිරිපිට රථවාහන නවතා තැබීමට වෙනත් සාප්පු හිමියෙකුට වෙන්කර දීම පිළිබඳව විරෝධය පල කරමින් එය නවත්වාදෙන ලෙස ඉල්ලා ඇති බව විගණනයට නිරීක්ෂණය විය.

6.4.4 විගණනය විසින් සිදුකල භෞතික පරික්ෂාවේදී ඇතැම් මන්ත්‍රීවරු වෙනුවෙන් එක් ලිපිනයක් යටතේ වාහන ගාල් කිරීමේ ඉඩකඩ දෙකක් වෙන් කර ඇති අවස්ථාද නිරීක්ෂණය විය.

6.4.4.1 අංක 40/1, කෙයිසර් වීදිය, කොළඹ 11 ලිපිනය නාගරික මන්ත්‍රීවරයෙකු විසින් වෙන් කරගෙන තිබූ අතර එම ස්ථානයෙහි පිහිටි JDM Elegance ආයතනය ඉදිරිපස වාහන නැවතුම් දෙකක් නාගරික මන්ත්‍රී වාහන වෙන් කිරීම් සලකුණු යොදා වෙන්කර තිබුණි.

6.4.5 මන්ත්‍රීවරුන්ට වාහන ගාල් කර තැබීම සඳහා වෙන් කර දී ඇති ස්ථානවල එම ස්ථානවල ව්‍යාපාර පවත්වාගෙන යන ව්‍යාපාරිකයින් විසින් වාහන ගාල් කර තිබූ බවට විගණනය කල භෞතික පරික්ෂාවේදී නිරීක්ෂණය විය.

6.4.6 කිරුළ පාර ස්ථානයෙහි පිහිටි ඩී.එල්. එන්ටර්ප්‍රයිසස් නමැති පෞද්ගලික ආයතනය විසින් පවත්වාගෙන යන රථගාල අසල වාහන 7ක් නවතා තැබිය හැකි බිම්කඩවල් 7ක් මන්ත්‍රීවරුන් හත්දෙනෙකු විසින් වෙන්කරගෙන තිබූ අතර මෙම මන්ත්‍රීවරුන් හත් දෙනා අංක 141, කිරුල පාර, කොළඹ 5 යන ලිපිනයෙහි මන්ත්‍රීවරුන්ගේ සුහද හමු මධ්‍යස්ථානයක් පවතින බවට සඳහන් කර සිදුකරන ලද ලිඛිත ඉල්ලීම් මත මෙම වාහන ගාල් කල හැකි ස්ථාන වෙන්කර දී තිබුණි. ඉල්ලීමට අනුව මහනගර සභාවේ තාක්ෂණ නිලධාරින් සිදුකල ස්ථානීය පරික්ෂාවේදී අදාල ලිපිනයෙහි අබාන්ස් පෞද්ගලික ආයතනය පවත්වාගෙන යන බවත් මන්ත්‍රීවරුන්ගේ සුහද හමු පවත්වන ස්ථානයක් පවත්වාගෙන නොයන බවත් තාක්ෂණික වාර්තාවේ දක්වා තිබුණි. විගණනය සිදුකල භෞතික පරික්ෂාවේදීද මෙකී ලිපිනයෙහි අබාන්ස් පෞද්ගලික ආයතනය පවත්වාගෙන යන බවට නිරීක්ෂණය වූ අතර වෙන්කරගෙන තිබූ වාහන 7ක් ගාල් කල හැකි ස්ථානයේ පෞද්ගලික වාහන ගාල් කර ඇති බවට නිරීක්ෂණය විය. ඒ අනුව මෙම ස්ථානයේ වාහන 7ක් ගාල්කල හැකි ස්ථානයක් වෙන් කර දීම මගින් මහ නගර සභාවට අය කරගත හැකිව තිබූ අදායම් අහිමි කර තිබූ බවට නිරීක්ෂණය විය.

6.4.7 කොළඹ නාගරික මන්ත්‍රීවරයෙකු තම කාර්යාලය අංක 82, කෙයිසර් වීදිය, කොළඹ 11 යන ලිපිනයෙහි ස්ථාපිත කර ඇති බව දක්වමින් සහා අනුමැතිය යටතේ වාහන නැවැත්වීමේ බිම්කඩක් එම ලිපිනයෙහි වෙන් කරගෙන තිබූ අතර අදාල ලිපිගොනු පරික්ෂා කිරීමේදී උක්ත ලිපිනයෙහි ව්‍යාපාරික කටයුතු පවත්වාගෙන යනු ලබන සුපුන් එන්ටර්ප්‍රයිසස් යන ආයතනය විසින් උක්ත මන්ත්‍රීවරයා නීති විරෝධි ලෙස තම ආයතනයේ ලිපිනය භාවිතා කරමින් වාහන බිම්කඩ වෙන්කරගෙන ඇති බවත් එම වෙන්කිරීම නිසා තම ආයතනය අපහසුතාවයට පත්වී ඇති බවත් දක්වමින් ආයතනයේ හිමිකරු විසින් නගර සභාවේ රථවාහන අංශයේ ඉංජිනේරු වෙත 2018 අගෝස්තු 13 දින ලිඛිතව දක්වා තිබුණි. එසේ වුවත්, 2018 සැප්තැම්බර් 27 දින අදාල වෙන්කිරීමට සභාවේ අනුමැතිය ලබාදීමට කටයුතු කිරීම විගණනයට ගැටලු සහගත විය.

6.4.8 කොළඹ මහ නගර සභා බල සීමාව තුල කොට්ඨාශ 47ක් සඳහා සභිකයින් 66 දෙනෙකු නිශ්චිතව නම් කර ගැසට් මගින් ප්‍රසිද්ධියට පත්කර ඇති අතර එම සභිකයින් නිශ්චිතව පත්

කර ඇති කොට්ඨාශ සඳහා සේවය කිරීමේ අවශ්‍යතාවය මත තම කාර්යාල කොට්ඨාශය තුල පවත්වාගෙන යා හැකි වුවත් මෙම සභිකයන් 66 දෙනාගෙන් රථවාහන ගාල් ඉඩකඩ වෙන්කරගෙන තිබූ සභිකයින් 58 දෙනා අතුරින් සභිකයින් 55 දෙනෙකුගේ කාර්යාල තම කොට්ඨාශයෙන් බැහැරව කොළඹ 11,12 ප්‍රදේශවල ලිපිනයන්හි කාර්යාල පවත්වාගෙන වාහන නැවැත්වීමේ ඉඩ එම ප්‍රදේශවල වෙන් කරගෙන ඇති බවට නිරීක්ෂණය විය. තවද මෙම කාර්යාල පවත්වාගෙන යන ප්‍රදේශ ඉතා කාර්ය බහුල ජනාකීර්ණ වෙළඳ ව්‍යාපාර පවත්වාගෙන යන වාහන නැවැත්වීමේ ඉඩකඩ ඉතා අවම ප්‍රදේශයන් බවට නිරීක්ෂණය විය.

6.4.9 නාගරික මන්ත්‍රීවරුන් වාහන නවතා තැබීම සඳහා පුද්ගල පදිංචිය අවම ව්‍යාපාරික වශයෙන් ඉතා කාර්යබහුල ජනාකීර්ණ මෙන්ම වාහන ගාල් කිරීම සඳහා පවතින ඉඩකඩ ඉතා අවම ප්‍රදේශයන්හි තම කාර්යාල පවත්වා ගෙන යන බවට දන්වා වාහන නැවැත්වීමට ඉඩ වෙන්කර තිබුණි. කොළඹ 11 ප්‍රදේශයේ ලිපිනයන්හි මන්ත්‍රීවරුන් 60 දෙනෙකු කාර්යාල පවත්වා ගෙන යන බවටත්, කොළඹ10 ප්‍රදේශයෙහි ලිපිනයන්හි මන්ත්‍රීවරුන් 13 දෙනකු කාර්යාල පවත්වා ගෙන යන බවටත් සඳහන් කර වාහන නවතා තැබීමේ ඉඩ වෙන්කරගෙන තිබූ බවට නිරීක්ෂණය වූ අතර මේ අතුරින් කොළඹ 11 හා 12 ප්‍රදේශයන්හි කුමාර වීදිය මන්ත්‍රීවරුන් 14 ක් ද, මැලිබන් වීදිය මන්ත්‍රීවරුන් 11 ක් ද, කෙයිසර් වීදිය මන්ත්‍රීවරුන් 09ක් ද, බැන්ක්ෂෝල්වීදිය මන්ත්‍රීවරුන් 09දෙනක් ද, වෙට්ටි වීදිය මන්ත්‍රීවරුන් 08ක් ද, චෙල්ල වීදිය මන්ත්‍රීවරුන් 07ක් ද, හරස් වීදිය මන්ත්‍රීවරුන් 05ක් ද, පරණ මුවර් වීදිය මන්ත්‍රීවරුන් 03ක් ද, සෝන්ඩර්ස් පෙදෙස මන්ත්‍රීවරුන් 03ක් ද, බෝධිරාජ මාවත මන්ත්‍රීවරුන් 02ක් ද, තම කාර්යාල පවත්වා ගෙන යන බවට සඳහන් කර වාහනය නවතා තැබීම සඳහා ඉඩ වෙන්කර ඇති බවට නිරීක්ෂණය විය. (ඇමුණුම 12)

6.4.10 මේ ආකාරයට මන්ත්‍රීවරුන් විශාල සංඛ්‍යාවක්, ව්‍යාපාරික වශයෙන් ඉතා කාර්ය බහුල ජනාකීර්ණ එකම ප්‍රදේශයක හා එකම වීදියක තම කාර්යාල පවත්වා ගෙන යන බවට දන්වා වාහන නැවැත්වීමේ ඉඩ වෙන්කර ගැනීම තුලින් සත්‍ය වශයෙන්ම කාර්යාල පවත්වා ගෙන යාම වෙනුවෙන් ඉඩකඩ වෙන්කර තිබුනේද යන්න විගණනයට ගැටලු සහගත බැවින් කිසියම් අක්‍රමිකතාවයක් නොවීය යන්න විගණනයේ දී බැහැර කල නොහැක.

